මාධ්‍ය නිවේදනය
සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477423 +94 11 2346257
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk
ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

| නිකුත් කළේ | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
|---|---|
| දිනය | 2021.10.15 |

# ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය - 2021 සැප්තැම්බර්

## 2021 සැප්තැම්බර් මාසයේ දී නිෂ්පාදන සහ සේවා යන ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක ඉහළ යන ලදී.

**නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 2021 අගෝස්තු මාසයට සාපේක්ෂව දර්ශකාංක 9.2කින් ඉහළ යමින් 2021 සැප්තැම්බර් මාසයේ දී 54.3ක අගයක් වාර්තා කරන ලදී.** නව ඇණවුම් සහ සේවා නියුක්තියේ සිදුවූ සැලකිය යුතු ඉහළ යාම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය.

විශේෂයෙන් රෙදිපිළි හා ඇඟලුම් නිෂ්පාදන අංශයේ සහ ආහාර හා පාන නිෂ්පාදන අංශයෙහි නව ඇනවුම් වල දක්නට ලැබුණු ඉහළ යාම නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකයේ සමස්ත ඉහළ යාම කෙරෙහි සැලකිය යුතු ලෙස දායක විය. ප්‍රධාන අපනයන ගමනාන්තයන්හි ආර්ථිකයන් යථාවත් වීමත් සමඟ අපනයන ඇණවුම් විශාල ප්‍රමාණයක් ලැබුණු බව රෙදිපිළි හා ඇඟලුම් නිෂ්පාදන අංශයේ සමහර ප්‍රතිචාර දැක්වූවන් සඳහන් කරන ලදී. වසංගත තත්ත්වයේ බලපෑම ක්‍රමයෙන් අඩුවීයාමත් සමඟ විශේෂයෙන්ම රෙදිපිළි හා ඇඟලුම් නිෂ්පාදන අංශයේ නව බඳවා ගැනීම් නැවත ආරම්භ කිරීම හේතුවෙන් සේවා නියුක්තිය ද ඉහළ ගොස් ඇත.

| විචල්‍යය | අගෝ. | සැප්. | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **ගැනුම් කළමනාකරුවගේ දර්ශකය** | **45.1** | **54.3** | **+** | **පහළ යෑමක සිට ඉහළ යෑමක්** |
| **උපදර්ශක** | | | | |
| නව ඇණවුම් | 42.6 | 55.5 | + | පහළ යෑමක සිට ඉහළ යෑමක් |
| නිෂ්පාදන | 37.8 | 49.0 | + | අඩු වේගයකින් පහළ යෑමක් |
| සේවා නියුක්තිය | 44.1 | 53.5 | + | පහළ යෑමක සිට ඉහළ යෑමක් |
| තොග මිලදී ගැනුම් | 43.1 | 49.0 | + | අඩු වේගයකින් පහළ යෑමක් |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | 64.9 | 65.0 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

කෙසේ වෙතත්, 2021 සැප්තැම්බර් මාසයේදී නිෂ්පාදනය හා තොග මිලදී ගැනුම් සුළු වශයෙන් පහළ යමින් කඩඉම් මට්ටමට ආසන්නව පැවතුණි. අමුද්‍රව්‍ය ලබා ගැනීමේ හැකියාව අඩු වීම හේතුවෙන් කර්මාන්තශාලා කටයුතු මන්දගාමී කිරීමට සිදු වූ බව ආහාර හා පාන වර්ග නිෂ්පාදන අංශයෙහි සමහර ප්‍රතිචාර දැක්වූවන් අවධාරණය කරන ලදී. තවද, විශේෂයෙන් ගෝලීය භාණ්ඩ මිල ඉහළ යාම හේතුවෙන් ආනයනික අමුද්‍රව්‍යවල මිල අඛණ්ඩව ඉහළ යාම සැළකියුතු තත්වයක් බව ඔවුන් අවධාරණය කරන ලදී. මේ අතර, ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය 2021 සැප්තැම්බර් මාසයේදී ඉහළ යන ලදී.


රට තුළ මෙන්ම ගෝලීය වෙළඳපොළවල ආර්ථික කටයුතු වඩාත් සාමාන්‍යකරණය වනු ඇතැයි අපේක්ෂාවෙන් ඉදිරි මාස තුන තුළ නිෂ්පාදන කටයුතු සඳහා වන අපේක්ෂාවන් තව දුරටත් ඉහළ මට්ටමක පැවතුණි.

**නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අගය**

**54.3**

**2021 අගෝස්තු මාසයට සාපේක්ෂව දර්ශකාංක 9.2ක ඉහළ යෑමකි**

නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

### ගෝලීය ප්‍රවණතා: නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

නිෂ්පාදන අංශයෙහි ගෝලීය ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, 2021 අගෝස්තු මාසයට සාපේක්ෂව 2021 සැප්තැම්බර් මාසයේදී 54.1ක දර්ශක අගයක් වාර්තා කරමින් නොවෙනස්ව පැවතුණි.

2021 සැප්තැම්බර් මාසයේදී ඉන්දියාවේ නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය වැඩි වේගයකින් ඉහළ ගිය අතර එක්සත් ජනපදය, යුරෝපා කලාපය සහ එක්සත් රාජධානියෙහි එම දර්ශක අඩු වේගයකින් ඉහළ යන ලදී. මේ අතර, චීනයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය කඩයිම් මට්ටමේ පැවති අතර, රුසියාවේ එම දර්ශකය අඩු වේගයකින් පහළ යන ලදී.

*මූලාශ්‍රය: මාකිට් [1] ආයතනය, 2021 ඔක්තෝබර් 14 වන දිනට*

*[1] මාකිට් යනු ලොව ප්‍රධාන පෙළේ මූල්‍ය තොරතුරු සේවා ලබාදෙන ආයතනයකි. මෙය ජාත්‍යන්තරව ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරන ප්‍රධාන ආයතනයක් වන අතර, එමඟින් යුරෝපා කලාපය ඇතුලුව රටවල් 30 කට අධික ප්‍රමාණයක් සඳහා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරනු ලබයි.*

**සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, 2021 අගෝස්තු මාසයේ දී දක්නට ලැබුණු පහත වැටීමෙන් පසුව, 2021 සැප්තැම්බර් මාසයේ දී 52.2ක දර්ශක අගයක් වාර්තා කරමින් වර්ධන කලාපයට නැවත ලඟා විය.** නව ව්‍යාපාර, නිමකිරීමට නියමිත කාර්යයන් සහ අපේක්ෂිත ව්‍යාපාර ක්‍රියාකාරකම් යන උප දර්ශකවල ඉහළ යෑම් මේ සඳහා හේතු විය.

ප්‍රධාන වශයෙන්, නැව් මගින් භාණ්ඩ ප්‍රවාහනය, මූල්‍ය සේවා, අධ්‍යාපන සහ විදුලි සංදේශ යන උප අංශවල දක්නට ලැබුණු වර්ධනයන් සමඟ නව ව්‍යාපාර අගෝස්තු මාසය හා සසඳන විට සැප්තැම්බර් මාසයේ දී ඉහළ ගියේය.

ව්‍යාපාර ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ගත් කල, නැව් මගින් භාණ්ඩ ප්‍රවාහනය, අධ්‍යාපනය සහ රක්ෂණ යන උප අංශ සැප්තැම්බර් මාසය තුළ වර්ධනය වීම් පෙන්නුම් කරන ලදී. කෙසේ වුවද, සැප්තැම්බර් මාසය පුරා පනවා තිබූ නිරෝධායන ඇඳිරි නීතිය හේතුවෙන් අනෙකුත් පෞද්ගලික සේවා, තොග සහ සිල්ලර වෙළඳාම, මහජන සෞඛ්‍ය කටයුතු සහ නවාතැන් සහ ආහාරපාන සැපයීම යන උප අංශ වල ව්‍යාපාර ක්‍රියාකාරකම්වලට විශාල වශයෙන් බලපෑම් ඇති විය. ඒ අනුව, ව්‍යාපාර ක්‍රියාකාරකම් උප දර්ශකය සැප්තැම්බර් මාසයේ දී ඉහළ ගියද එය තවදුරටත් කඩඉම් මට්ටමට වඩා පහළ අගයක පැවතුණි.

නව බඳවා ගැනීම් සංඛ්‍යාව, විශ්‍රාම යෑම් සහ ස්වේච්ඡාවෙන් සේවයෙන් ඉවත්වීම් සංඛ්‍යාවට සාපේක්ෂව අඩු මට්ටමක පැවතීම හේතුවෙන් සේවා නියුක්ති උප දර්ශකය අඛණ්ඩව කඩඉම් මට්ටමට වඩා පහළ අගයක පැවතුණි. මේ අතර, දිගු කාලීන සංචරණ සීමා මධ්‍යයේ සීමිත කාර්ය මණ්ඩලයක් පමණක් සේවයට වාර්තා කිරීම සහ කාර්ය මණ්ඩල සාමාජිකයින්ට COVID-19 ආසාදනය වීම හේතුවෙන් නිමකිරීමට නියමිත කාර්යයන් අඛණ්ඩව සැප්තැම්බර් මාසයේ දී ඉහළ ගියේය.

| විචල්‍යය | අගෝ. | සැප්. | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **ගැනුම් කළමනාකරුවගේ දර්ශකය** | **46.2** | **52.2** | **+** | **පහළ යෑමක සිට ඉහළ යෑමක්** |
| | | <u>උපදර්ශක</u> | | |
| නව ව්‍යාපාර | 40.2 | 54.0 | + | පහළ යෑමක සිට ඉහළ යෑමක් |
| ව්‍යාපාර ක්‍රියාකාරකම් | 35.3 | 46.5 | + | අඩු වේගයකින් පහළ යෑමක් |
| සේවා නියුක්තිය | 47.5 | 40.3 | - | වැඩි වේගයකින් පහළ යෑමක් |
| නිමකිරීමට නියමිත කාර්යයන් | 60.8 | 54.8 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| අපේක්ෂිත ඉදිරි ව්‍යාපාර ක්‍රියාකාරකම් | 47.1 | 65.6 | + | පහළ යෑමක සිට ඉහළ යෑමක් |


මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

සංචරණ සීමා ඉවත් කිරීම සහ රට තුළ COVID-19 ආසාදිතවූවන්ගේ සංඛ්‍යාව පහළ යෑම සමඟ ඉදිරි මාස තුන සඳහා ව්‍යාපාර ක්‍රියාකාරකම් පිළිබඳ අපේක්ෂාවන් සැප්තැම්බර් මාසයේ දී ඉහළ යන ලදී. එසේ වුවද, සමහර ප්‍රතිචාර දක්වන්නන් ආනයන සීමා කිරීම් සහ යෙදවුම් පිරිවැය ඉහළ යෑම හේතුවෙන් ව්‍යාපාරික කටයුතුවලට සිදු වන අහිතකර බලපෑම් පිළිබඳව අවධාරණය කරන ලදී.

**සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අගය**

**52.2**

**2021 අගෝස්තු මාසයට සාපේක්ෂව දර්ශකාංක 6.0ක ඉහළ යෑමකි.**



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

## ගෝලීය ප්‍රවණතා: සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

ගෝලීය සේවා ක්‍රියාකාරකම්හි තවදුරටත් ඉහළ යෑමක් පෙන්නුම් කරමින්, ගෝලීය සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 2021 අගෝස්තු මාසයේ පැවති 52.8 සිට 2021 සැප්තැම්බර් මාසයේ දී 53.4 දක්වා ඉහළ ගියේය.

ඇමරිකා එක්සත් ජනපදය, චීනය, ඉන්දියාව සහ එක්සත් රාජධානිය යන රටවල සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක මගින් එම රටවල සේවා අංශ පසුගිය මාසයට සාපේක්ෂව 2021 සැප්තැම්බර් මාසයේ දී වර්ධනයක් පෙන්නුම් කරන ලද අතර, ජපානයේ එය පහළ යෑමක් පෙන්නුම් කළේය.

*මූලාශ්‍රය: මාකිට් [1] ආයතනය, 2021 ඔක්තෝබර් 14 වන දිනට*

***තාක්ෂණික සටහන:***

**දර්ශකය**

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 0 සිට 100 අතර අගයන් පරාසයක විහිදී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට සමාන නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී නොවෙනස්ව පැවතී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා වැඩි නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී වර්ධනයක් පෙන්නුම් කරයි.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා අඩු නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී සංකෝචනයට ලක්වී ඇති බව පෙන්නුම් කරයි.

**නියැදිය**

මෙම සමීක්ෂණයෙහි නියැදි රාමුව සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවෙන් ලබාගන්නා ලද බස්නාහිර පළාතෙහි ස්ථානගත වී ඇති විශාල සමාගම් මත පදනම් වී ඇත. දළ දේශීය නිෂ්පාදිතයට දක්වන ආංශික දායකත්වය පදනම් කර ගනිමින් නිෂ්පාදන සහ සේවා කටයුතු සඳහා මාසිකව ප්‍රතිචාර 100 බැගින් වූ ඉලක්කයක් පවත්වාගෙන යනු ඇත.

**විචල්‍යයන්ගේ අර්ථ නිරූපණයන්**

| | |
|---|---|
| සේවා නියුක්තිය | : සමාගම සඳහා සේවය ලබාදෙන සේවකයන් ගණන |
| ගැනුම් තොගය | : නිෂ්පාදනය සඳහා යොදාගැනීමේ අරමුණින් මිල දී ගෙන ගබඩාවෙහි තබා ඇති අමු ද්‍රව්‍ය |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | : සැපයුම්කරුවෙකුට ඇණවුමක් ලබාදීමෙන් පසු එය කර්මාන්ත ශාලාවට ලැබීමට ගතවන කාලය |
| නිමකිරීමට නියමිත කාර්යයන් | : ව්‍යාපාරික ක්‍රියාකාරකම් ඉහළයාම හේතුවෙන් නිම කිරීමට නොහැකි වූ ඇණවුම් |

අනෙකුත් විචල්‍යයන් ඒවා නම් කිරීම සඳහා යොදා ඇති වචනාර්ථයෙන්ම පැහැදිලි වේ.